**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2275 - එස්ආර්අයි) - 2012**

**--------------------------------------------------------------------------------------------------------------**

**1. මතය**

**--------**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූ බවත්ය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මූල්‍ය කාර්ය සාධනය**

**------------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.324,131,293 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,954,191,089 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 134,289,016 | 264,433,364 | 1,329,246,730 |
| උපකරණ හා ද්‍රව්‍ය | 178,177,855 | 45,529,241 | 584,890,047 |
| පොලී ගාස්තු (අතිරේක) | 11,064,422 | 9,680,088 | 40,054,312 |
| එකතුව | 324,131,293 | 319,642,693 | 1,954,191,089 |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹි ණය ගිවිසුම අනුව, 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා අරමුදල් සපයන නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද රු.51,575,515 ක් වූ පොලිය, පොලී වියදම් හා ආසියානු සංවර්ධන බැංකු ණය ලෙස ගිණුම් කළ යුතු වුවද, 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවන ලද රු.40,054,312 ක් වූ පොලිය ශ්‍රී ලංකා රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර එළඹි අතිරේක ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ පොලී වියදම් හා ගෙවිය යුතු පොලී ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් 2012 දෙසැම්බර් 31 දිනට පොලී වියදම් හා ආසියානු සංවර්ධන බැංකු ණය පිළිවෙලින් රු.11,521,203 කින් හා රු.51,575,515 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.49,393,223 ක් වූ මුදල් මහා භාණ්ඩාගාරයෙන් කිසිදු සීමා කිරීමක් හෝ එකඟතාවයක් ලබාගැනීමෙන් තොරව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අරමුදල් හා ශ්‍රී ලංකා රජයෙන් දායකය ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 4.1 අරමුදල් උපයෝජනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ වෙන්කරන ලද අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු වස්, සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදි වශයෙන් වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් එම සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ආසබැ | ශ්‍රීලංර | එකතුව |
|---|---|---|---|
| එකඟවූ දායකය (එජඩො මිලියන වලින් ) | 13.5 | 8.0 | 21.5 |
| 2012 දෙසැම්බර් 31 දක්වා තථ්‍ය වියදම (එජඩො මිලියන වලින් ) | 10.4 | 6.6 | 17.0 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 77 | 82.5 | 79.1 |

(ඇ) මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් (මුදල් පදනම ) |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආසබැ | 13.5 | 1,442.66 | 176.11 | 169.36 | 1,179.66 |
| ශ්‍රී ලංකා රජය | 8.0 | 902.30 | 80.30 | 71.29 | 720.81 |
| එකතුව | 21.5 | 2,344.96 | 256.41 | 240.65* | 1,900.47* |

* උපචිත වියදම්වල බලපෑම් හේතුවෙන් මෙම වාර්තාවේ 2.1 ජේදයේ දැක්වෙන සංඛ්‍යා වලින් ඉහත සඳහන් සංඛ්‍යා වෙනස් වේ.

## 4.2 භෞතික ප්‍රගතිය

බෙදාහැරීම් නළ සැපයිම හා එළීම් සහ උස් ජල කුළුණු ඉදිකිරීම (PE4) සඳහා කොන්ත්‍රාත්තුව 2012 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. හම්බන්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ලුණු බාධකය ඉදිකිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්තුව 2007 මැයි වන විට නිම කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණි. කෙසේ වුවද මෙම කොන්ත්‍රාත්තුව සඳහා යළි ලංසු කැඳවීමට සිදුවී තිබුණු අතර පසුව එය 2009 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කර තිබුණි. අත්තිවාරමේ අනපේක්ෂිත යටිපස ස්වභාවයක් ඇති වීම හා ජල ගැලීම් ගණනාවක් සිදුවීම හේතුවෙන් ලුණු බාධකය ඉදිකිරීම ප්‍රමාදවී තිබුණි. එබැවින් කොන්ත්‍රාත් කාලය 2013 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ඉහත සඳහන් කොන්ත්‍රාත් දෙකෙහි භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| පැකේජ අංකය / ව්‍යාපෘති කාර්යය | 2012 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කය | 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය භෞතික ප්‍රගතිය | වෙනස |
|---|---|---|---|
| | | | % |
| **SB/UWS/PB2/HAM/ICB** | | | |
| අම්බලන්තොටදී වලවේ ගඟ හරහා ලුණු බාධකය ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම | 100 | 90 | 10 |
| **PW&ET/UWS/PE4/POL/ICB** | | | |
| බෙදාහැරීම් නළ සැපයීම හා එළීම සහ උස් ජල කුළුණු ඉදිකිරීම | 100 | 100 | |